**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
தேசிய மதிப்பீட்டிற்கும் பரீட்சித்தலுக்குமான சேவை
**Department of Examinations, Sri Lanka**
NATIONAL EVALUATION AND TESTING SERVICE

**පැලවත්ත, බත්තරමුල්ල.**
பெலவத்தை, பத்தரமுல்ல
Pelawatta, Battaramulla.

මගේ අංකය / எமது இல / My No: 6/5/ප්‍රතිඵල/2023
ඔබේ අංකය / உமது இல / Your No: ............
දිනය / திகதி / Date: 2023.11.16

දුරකථන / தொலைபேசி / Telephones: 2786200, 2784201, 2785202, 2784203, 2784204, 2786205, 2784206,
ෆැක්ස් / பெக்ஸ் / Fax: 011-2785220
තැපැල් ලිපිනය / அஞ்சல் முகவரி / POSTAL ADDRESS: තැ.පෙ. 1503, කොළඹ / த.பெ. 1503 கொழும்பு / P.O.Box 1503 Colombo
අන්තර්ජාල ලිපිනය / இணையதள முகவரி / Internet Address: www.doenets.lk
E-mail : examd@sltnet.lk


සියලු ම විදුහල්පතිවරුන් වෙත,

**<u>පාසල්වලට සිසුන් තෝරා ගැනීමට හා ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට</u>**
**<u>5 ශ්‍රේණිය සිසුන් සඳහා පැවැත්වූ විභාගය - 2023 ප්‍රතිඵල නිකුත් කිරීම</u>**

විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය www.doenets.lk ඔස්සේ ඔබ වෙත ලබා දී ඇති පරිශීලක නාමය හා රහස්‍ය මුරපදය භාවිතයෙන් ඔබගේ පාසලේ ප්‍රතිඵල ලේඛනය බාගත කොට මුද්‍රණය කර ගැනීමට පහසුකම් සලසා ඇති බව කාරුණිකව දැනුම් දෙමි. එම ප්‍රතිඵලවල මුද්‍රිත පිටපතක් පාසලේ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කර අදාළ සිසුන්ට දැන ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතු ය. අපේක්ෂකයන්ගේ කේවල සහතිකපත් ප්‍රතිඵල නැවත සමීක්ෂණයෙන් පසු ඔබ වෙත තැපැල් මගින් එවීමට කටයුතු කරන අතර එම සහතිකපත් අදළ විභාග අපේක්ෂකයන් වෙත නොපමාව ලබා දීම අනිවාර්ය වේ. **පාසලට අදළ ප්‍රතිඵල ලේඛනයේ මුද්‍රිත පිටපතක් නැවත ඔබ වෙත එවීමට කටයුතු නොකරන බැවින් භාගත කර ගන්නා ලද ප්‍රතිඵල ලේඛනය ඉදිරි අවශ්‍යතා වෙනුවෙන් පාසලේ සුරක්ෂිතව තබා ගන්නා මෙන්ද වැඩිදුරටත් දන්වමි.**

02. ජනප්‍රිය පාසල්වලට සිසුන් තෝරා ගැනීමට හා ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීම සඳහා ඒ ඒ දිස්ත්‍රික්කවලට අදාළ අවම කඩඉම් ලකුණු සීමා පහත දක්වේ. ඒ සඳහා සුදුසුකම් ලබා ඇති සිසුන්ගේ නම් ඉදිරියෙන් **"QUALIFIED"** යනුවෙන් ද සුදුසුකම් ලබා නොමැති සිසුන්ගේ නම් ඉදිරියෙන් කඩඉරි තුනක්ද ද සඳහන් වේ. ඊට අමතරව ශිෂ්‍යාධාර ලැබීමට සුදුසුකම්ලත් සිසුන්ගේ නම් ඉදිරියෙන් ඇති ආදායම් තීරුවේ **"BELOW"** යනුවෙන් සඳහන් කර ඇත. එවැනි සිසුන් වෙනුවෙන් පමණක් ශිෂ්‍යාධාර ලබා ගැනීම සඳහා නියමිත අයදුම්පත් (බී ආකෘතිය) කලාප අධ්‍යාපන කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

03. ජනප්‍රිය පාසල් ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුත්තේ දිස්ත්‍රික්කයේ අවම කඩඉම් ලකුණු සීමාව හා ඊට වැඩි ලකුණු ලබා ඇති **"QUALIFIED"** යනුවෙන් සඳහන් සිසුන් පමණි. එම අයදුම්පත් අදාළ ශිෂ්‍යයා/ ශිෂ්‍යාව ඉගෙනුම ලබන පාසල අයත් කලාපයේ අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් බත්තරමුල්ල, ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් කටයුතු ශාඛාවට යොමු කළ යුතු ය.

04. **අමප/19/2354/127/064 දරන 2019.09.11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සඳහා ශිෂ්‍යත්ව 250 ක් වෙන් කර ඇති** අතර එම සිසුන් තෝරා ගැනීමේදී පහත දැක්වෙන ක්‍රමවේදයන් අනුගමනය කර ඇත.

i. විශේෂ අවශ්‍යතා සහිත වූවද අඩු ආදායම්ලාභී සිසුන්ට දිස්ත්‍රික් අවම කඩඉම් ලකුණු සීමාව හා ඊට ඉහළ ලකුණු ලබා ඇත්නම් සාමාන්‍ය ක්‍රමය යටතේ ශිෂ්‍යාධාර ලැබීමට හා ජනප්‍රිය පාසලක් අයදුම් කිරීමට හිමිකම් ලැබේ.

ii. විශේෂ අවශ්‍යතා සහිත අඩු ආදායම්ලාභී පවුල්වල සිසුන් අදාළ දිස්ත්‍රික් අවම කඩඉම් ලකුණු සීමාවට වඩා අඩු වූවද, එවැනි සිසුන්ගේ නම ඉදිරියෙන් **"QUALIFIED - SPECIAL NEEDS"** යනුවෙන් සඳහන් අපේක්ෂකයින්ට පමණක් ශිෂ්‍යාධාර හිමිකම් ලැබේ.

iii. විශේෂ අවශ්‍යතා සහිත වැඩි ආදායම්ලාභී පවුල්වල සිසුන් ලබාගත් ලකුණු අදාළ දිස්ත්‍රික් අවම ලකුණු සීමාවට ඉහළ හෝ පහළ වූවද නම ඉදිරියෙන් **"QUALIFIED - SPECIAL NEEDS"** යනුවෙන් සඳහන් වන අවස්ථාවලදී ශිෂ්‍යාධාර ලැබීමට හිමිකම් ලැබේ. එහෙත් ඔවුන් අතුරෙන් ජනප්‍රිය පාසල් සඳහා අයදුම් කිරීමට හැකියාව ඇත්තේ අදාළ දිස්ත්‍රික් අවම ලකුණු සීමාව හෝ ඊට වැඩි සිසුන්ට පමණි.

05. මෙම විභාග ප්‍රතිඵල නිකුත් කිරීමට පෙර අවස්ථා කිහිපයකදී ම සියුම් පරීක්ෂා කිරීම් රාශියක් සිදු කර ප්‍රතිඵලවල නිරවද්‍යතාව තහවුරු කර ඇත. එසේ වුව ද යම් සිසුවෙකුගේ ප්‍රතිඵලය පිළිබඳ ව සෑහීමකට පත් නොවන්නේ නම් 05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේ අභියාචනා ඉල්ලුම් කිරීම 2023.11.27 දින සිට 2023.12.04 දක්වා මාර්ගගත පද්ධතිය (Online system) ඔස්සේ සිදු කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ක්‍රමවේදයන් අනුගමනය කරන්න.

1. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පාසල වෙත ලබා දී ඇති පරිශීලක නාම (user name) හා මුර පදය (Password) භාවිත කරමින් School Account වෙත පිවිසෙන්න.
2. අභියාචනාවට අදාළ විභාග අංකය ඇතුළත් කරන්න. ඒ සමඟ තිරයේ දිස්වන නම හා ලබා ඇති ලකුණු නිවැරදි බවට පරීක්ෂා කර එය තහවුරු කරන්න.
3. අනෙකුත් අපේක්ෂකයන්ගේ තොරතුරු ද ඒ අනුව ඇතුළත් කරන්න.
4. අභියාචනා අයදුම්කරන ලද සියළු සිසුන්ගේ තොරතුරු ඇතුළත් සාරාංශ වාර්තාව බාගත (Download) කරන්න.
5. එහි දෘඪ පිටපත (Hard Copy) සමඟ එක් එක් සිසුවාට අදාළ පහත සඳහන් ලේඛන අමුණා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ 1503, කොළඹ යන ලිපිනයට 2023 දෙසැම්බර් 04 දිනට පෙර විදුහල්පති විසින් ඉදිරිපත් කරන්න.

- ❖ එක් එක් අයදුම්කරුවන්ගේ සාධනය පිළිබඳව වෙන වෙනම සකස් කළ පන්ති භාර ගුරුවරයාගේ නිර්දේශය
- ❖ එක් එක් අපේක්ෂකයා පෙන්වා ඇති විශේෂ දක්ෂතා හා කුසලතා වෙන වෙනම සඳහන් කළ වාර්තාව

**5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය 2023**
**අභියාචනා උත්තරපත්‍ර පරීක්ෂාව**

පාසලේ නම : ........................................................ දුරකථන අංකය : .......................

| අනු අංකය | විභාග අංකය | ශිෂ්‍යයාගේ/ ශිෂ්‍යාවගේ නම | ලබා ඇති ලකුණු |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

විදුහල්පතිගේ නම : ..............................................................................................

දිනය : .................................... අත්සන : .....................................

(නිල මුද්‍රාව තබන්න)

06. දිස්ත්‍රික් කඩඉම් අවම ලකුණු සීමාව

| අවම ලකුණු සීමා | | | |
|---|---|---|---|
| දිස්ත්‍රික්කය | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය |
| 01. | කොළඹ | 154 | 147 |
| 02. | ගම්පහ | 154 | 147 |
| 03. | කළුතර | 154 | 147 |
| 04. | මහනුවර | 154 | 147 |
| 05. | මාතලේ | 154 | 147 |
| 06. | නුවරඑළිය | 146 | 144 |
| 07. | ගාල්ල | 154 | 147 |
| 08. | මාතර | 154 | 147 |
| 09. | හම්බන්තොට | 150 | 143 |
| 10. | යාපනය | | 145 |
| 11. | කිලිනොච්චි | | 144 |
| 12. | මන්නාරම | 145 | 143 |
| 13. | වව්නියාව | 145 | 145 |

| අවම ලකුණු සීමා | | | |
|---|---|---|---|
| දිස්ත්‍රික්කය | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය |
| 14. | මුලතිව් | 145 | 145 |
| 15. | මඩකලපුව | | 145 |
| 16. | අම්පාර | 148 | 145 |
| 17. | ත්‍රිකුණාමලය | 146 | 144 |
| 18. | කුරුණෑගල | 154 | 147 |
| 19. | පුත්තලම | 148 | 143 |
| 20. | අනුරාධපුරය | 148 | 143 |
| 21. | පොළොන්නරුව | 149 | 143 |
| 22. | බදුල්ල | 149 | 144 |
| 23. | මොණරාගල | 149 | 143 |
| 24. | රත්නපුර | 150 | 144 |
| 25. | කෑගල්ල | 154 | 147 |

එච්.ජේ.එම්.සී. අමිත් ජයසුන්දර
විභාග කොමසාරිස් ජනරාල්

එච්.ජේ.එම්.සී. අමිත් ජයසුන්දර
විභාග කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

පිටපත් ඃ 01. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය - කරු. දැ.පි.
02. අධ්‍යාපන අධ්‍යක්ෂ, පාසල් කටයුතු ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය - අවශ්‍ය කටයුතු සඳහා
03. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ - කරු. දැ.පි.
04. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - කරු. දැ.පි.